# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බෞද්ධ සංස්කෘතිය

## 08 න පාඩම ; බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය

### [[ 2024/2025 ]] 04 වන ප්‍රශ්නය

I දාගැබක ගර්භයේ හැඩයේ ආකාරය අනුව ස්ථූප නම් කෙරෙන අතර, ඒ අනුව දාගැබ් නිර්මාණය කෙරෙන ආකාර හතරක් නම් කර, එයින් එකක් උදාහරණයක් සහිතව කෙටියෙන් හඳුන්වන්න.

II දාගැබක පවත්නා මූළික අංග පිළිවෙළින් නම් කරන්න.

III බෞද්ධ කලා නිර්මාණයක්වූ වටදාගෙය උදාහරණ සහිතව විස්තර කරන්න.

### 05 වන ප්‍රශ්නය

I පැරණී බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසීම සඳහා ඇති දොරටුව ප්‍රධාන කළා අංග කීපයකින් සමන්විතය. එම කළා අංග නම් කර, ඒවා පිළිබඳ විස්තරයක් කරන්න.

### [[ 2020/2021/2022/2023 ]] 04 වන ප්‍රශ්නය

II බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය යටතේ දාගැබ් වහන්සේට වැදගත් ස්ථානයක් හිමිවන ආකාරය දක්වා, මහින්දාගමනයෙන් පසු ලක්දිව පිහිටුවන ලද ථූපාරාම දාගැබ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

III බෞද්ධ චෛත්‍යක තිබිය යුතු අංග මොනවාදැයි අනුපිළිවෙළින් විමර්ශනය කරන්න.

### 05 වන ප්‍රශ්නය

I බෝධිය හා පටිමාඝර හෙවත් පිළිමගෙය බෞද්ධයන්ට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

II බෝධිඝරය හා එය තැනීමේ අරමුණු පැහැදිලි කර ලක්දිව පිහිටි පැරණි බෝධිඝර දෙකක් ගැන විස්තර සපයන්න.

III බුදුන් වහන්සේ ජීවමානව වැඩ සිටිද්දී පවා බෝධීන් වහන්සේ පුදපූජාවලට පාත්‍ර වූ ආකාරය විමර්ෂණය කරන්න.

### 06 වන ප්‍රශ්නය

I වටදාගෙය හඳුන්වා මැදිරිගිරිය හා තිරියාය වටදාගේ ගැන විස්තරයක් කරන්න.

II ටැම්පිට පිළිම ගේ හඳුන්වා, ලක්දිව පවත්නා ටැම්පිට පිළිම ගෙවල් දෙකක් ගැන තොරතුරු සපයන්න.

III උපෝසථාගාරය හඳුන්වා, ලක්දිව පිහිටි උපෝසථාගාර දෙකක් ගැන කරුණු දක්වන්න.

## [[ 2019/2020 ]] 04 වන ප්‍රශ්නය

I චේතියඝර හඳුන්වා, ඒවා තැනීමේ අරමුණු දක්වන්න.
II ලංකාවේ පිහිටි ප්‍රාග් බෞද්ධ ස්ථූප ගැන විස්තරයක් කරන්න.
III බුබ්බුලාකාර චෛත්‍ය හඳුන්වා, ඒවා පිහිටි ස්ථාන දෙකක් පිළිබඳ විස්තර කරන්න.

## [[ 2018/2019 ]] 04 වන ප්‍රශ්නය

I බුදුරදුන් ජීවමානව සිටියදීම ස්ථූප නිර්මාණය ආරම්භ වූ බව තහවුරු කළ හැකි සාධක ගෙනහැර දක්වන්න.
II උපෝෂථාඝාර යනු කුමක්දැයි හඳුන්වා, පැරණි උපෝෂථාඝාර දෙකක් පිළිබඳ විස්තර කරන්න.
III අනුරාධපුරයෙහි දක්නට ලැබෙන විශාල චෛත්‍ය හඳුන්වා, ඒවා ඉදි කළ නරපතියන් පිළිබඳ විස්තරයක් කරන්න.

## [[ 2017/2018 ]] 04 වන ප්‍රශ්නය

I වටදාගෙය හඳුන්වා, ශ්‍රී ලංකාවේ දක්නට ලබෙන පැරණි වටදා ගෙවල් දෙකක් ගැන විස්තර සපයන්න.
II ලංකාතිලකය හා ගඩලාදෙණිය විහාරවල පවත්නා ඓතිහාසික හා ආගමික වැදගත්කම විමර්ශනය කරන්න.
III ටැම්පිට පිළිමගෙවල් පිළිබඳ හැඳින්වීමක් කොට, ඒවා පිහිටි ඓතිහාසික ස්ථාන දෙකක් ගැන තොරතුරු සපයන්න.

## [[ 2015/2016 ]] 03 වන ප්‍රශ්නය

I –
II –
III භාරතීය හා ශ්‍රී ලාංකේය ඓතිහාසික තොරතුරු පාදක කර ගනිමින් බෝධිඝරයේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමර්ශනයක් කරන්න.

## 04 වන ප්‍රශ්නය

I ‘පටිමාඝර’ යනු කවරේදැයි හඳුන්වා මේවායේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමර්ශනයක් කරන්න.

II ගම්පොල යුගයට අයත් ලංකාතිලක හා ගඩලාදෙණි විහාරවල පවත්නා ඓතිහාසික, ආගමික හා ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කම පැහැදිලි කරන්න.

III ටැම්පිට පිළිම ගෙවල්වල ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

## 05 වන ප්‍රශ්නය

I උපෝෂථාඝාරවල ශාසනික වැදගත්කම පැහැදිලි කරමින් අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් උපෝෂථාඝාර දෙකක් ගැන විස්තර ඉදිරිපත් කරන්න.

II “පධානඝර” යනු කවරේ දැයි හඳුන්වා මෙරට පෞරාණික පධානඝර දෙකක් ගැන තොරතුරු සපයන්න.

III ‘ආසනඝරවල’ පවත්නා ආගමික සුවිශේෂත්වය දක්වා, මෙරට පෞරාණික ආසනඝර දෙකක් ගැන විස්තර සපයන්න.

## [[ 2014/2015 ]] 04 වන ප්‍රශ්නය

I ශ්‍රී ලංකාවේ බෞද්ධ ස්ථූප නිර්මාණයේ ආරම්භය හඳුන්වා, අනුරාධපුරයේ හා පොළොන්නරුවේ දක්නට ලැබෙන ස්ථූප පිළිබඳ විමසීමක් කරන්න.

II ‘චේතියඝර’ යනු කවරේදැයි හඳුන්වා, ලක්දිව දක්නට ලැබෙන පැරණි චේතියඝර පිළිබඳව විස්තර කරන්න.

III බෞද්ධ ස්ථූපවල දක්නට ලැබෙන ආකෘති කවරේදැයි හඳුන්වා, මෙයින් ලක්දිව වඩාත් ජනප්‍රිය වී ඇති ආකෘති පෙන්වා දෙන්න.

## [[ 2012/2013 ]] 04 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේගේ ජීවමාන කාලයෙහි පවා ලක්දිව චෛත්‍ය පැවති බවට දැක්විය හැකි සාධක විමර්ශනය කරන්න.

II චේතිය හෙවත් චෛත්‍ය හා දාගැබ් යන ව්‍යවහරයන්හී ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ විමසීමක් කරන්න.

III දාගැබක දක්නට ලැබෙන ප්‍රධාන අංග පිළිබඳ විශ්ලේෂණයක් කරන්න.

## 05 වන ප්‍රශ්නය

I පටිමාඝර යනු කවරේද? ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පටිමා ඝර දෙකක් ගැන විස්තර කරන්න.

II ටැම්පිට තැනූ පිළිම ගෙවල්වල ආරම්භය හඳුන්වා, ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන එබඳු පිළිම ගෙවල් දෙකක් ගැන තොරතුරු සපයන්න.

III ආසන ඝර යනු කවරේදැයි හඳුන්වා, ශ්‍රී ලංකාවේ පිහිටි ආසන ඝර දෙකක් ගැන විස්තර සපයන්න.

## [[ 2011/2012 ]] 05 වන ප්‍රශ්නය

I බුදුදහමෙහි දැක්වෙන ත්‍රිවිධ චෛත්‍යය කවරේදැයි පැහැදිලි කරන්න.

II දාගැබ් නිර්මාණයේදී උපයෝගී කොටගත් ආකෘතික ලක්ෂණ අනුව වර්ගීකරණය කළ හැකි ආකාරය විමර්ශනය කරන්න.

III චේතියඝර නිර්මාණයේදී ආරම්භය හා විකාශනය නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

## [[ 2010/2011 ]] 04 වන ප්‍රශ්නය

I ස්ථූපය හැඳින්වෙන වෙනත් නම් තුනක් සඳහන් කරන්න.

II –

III පධානඝර, ටැම්පිට විහාර,ගෙඩිගෙය කෙටිසටහන් ලියන්න.

## [[ 2009/2010 ]] 04 වන ප්‍රශ්නය

I ස්ථූප නිර්මාණයේ දක්නට ලැබෙන විවිධ ආකෘති පිළිබඳව හැඳින්වීමක් කරන්න.

II -

III චේතියඝර, වාහල්කඩ,කොරවක්ගල්,අවුකන හිටි පිළිමය,බෝධිඝරය යන නිර්මාණවලින් එකක් ගැන කෙටි සටහන් ලියන්න.

## [[ 2008/2009 ]] 04 වන ප්‍රශ්නය

I ස්ථූපයක ධාතු ගර්භයේ හැඩය කී වැදෑරුම්ද ඒවා නම් කරන්න.

II –

III සංඝාරාම,රත්නප්‍රාසාදය,උපෝසථාඝාර, ප්‍රධානඝර,ආසනඝර යන නිර්මාණවලින් එකක් ගැන කෙටි රචනයක් ලියන්න.

## [[ 2007/2008 ]] 04 වන ප්‍රශ්නය

I ස්ථූපයක උපරිභාගයේ විද්‍යමාන වන අංග නම් කරන්න.

II පොළොන්නරු ගල් විහාරයේ දක්නට ඇති පිළිම හඳුන්වා දෙන්න.

III කෙටිසටහන් ලියන්න.
ලංකාතිලකය, වටදාගේ

## [[ 2006/2007 ]] 04 වන ප්‍රශ්නය

I ස්ථූප වර්ග නම් කොට, ඒවා අතුරින් ලක්දිව වඩාත් ජනප්‍රිය ස්ථූප විශේෂය හඳුන්වා දෙන්න.

II –

III ආසනඝර,පධානඝර,උපෝසථාඝාර,බෝධිඝර යන මේවායින් එකක් හඳුන්වා, ඒ පිළිබඳ ඓතිහාසික තොරතුරු ගෙනහැර දක්වන්න.

## [[[[[ 2005 ]]]]] 05 වන ප්‍රශ්නය

I –

II පටිමාඝර,බෝධිඝර ගැන හැඳින්වීමක් කරන්න.

## [[[[[ 2004 ]]]]] 04 වන ප්‍රශ්නය

I “වැවයි,දාගැබයි” පිළිගත් බෞද්ධ සංකල්පයක් වූයේ කෙසේදැයි පහදන්න.

## [[[[[ 2003 ]]]]] 04 වන ප්‍රශ්නය

I පැරණිම දාගැබක දක්නට ලැබුණේ කවර අංග දැයි ලියන්න.
II ථූපාරාම, රුවන්වැලි මහා සෑය මින් එකක් කෙටියෙන් හඳුන්වන්න.
III ලාංකික බෞද්ධයන් චෛත්‍ය වන්දනාවට නැඹුරුවූයේ ඇයි දැයි විමසන්න.

## [[[[[ 2002 ]]]]] 04 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ නියෝජනය කරනු ලබන ප්‍රධාන බෞද්ධ සංඛේත තුන සැකෙවින් හඳුන්වන්න.
II එම සංඛේත තුනෙන් එකක් පිළිබඳව විස්තරයක් කරන්න.
III බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයේ වැදගත් ලක්ෂණ ප්‍රකට කෙරෙන පැරණි ඓතිහාසික සිද්ධස්ථානයක් පිළිබඳ විස්තරයක් කරන්න.

## 05 වන ප්‍රශ්නය

I –
II මහියංගණ,ථූපාරාම,අම්බස්ථල දාගැබ් තුළ නිදන් කොට ඇති ධාතූන් වහන්සේලා නම් වශයෙන් ලියා මේවායින් එක් චෛත්‍යයක් පිළිබඳ විස්තරයක් කරන්න.

## [[[[[ 2001 ]]]]] 04 වන ප්‍රශ්නය

I ලක්දිව ගොඩනංවන ලද ප්‍රථම ඓතිහාසික ථූපය නම් කොට, එය කවරකු විසින් කුමක් නිදන් කොට කරන ලද්දේදැයි ලියන්න.

## [[[[[ 2000 ]]]]] 04 වන ප්‍රශ්නය

I මහියංගණ, රත්නමාලී, ථූපාරාම යන සිද්ධස්ථාන තුන විශේෂත්වයට පත්වන ප්‍රධාන කරුණු තුනක් වෙන් වෙන් වශයෙන් ලියන්න.

## [[[[[ 1999 ]]]]] 04 වන ප්‍රශ්නය

I ගර්භ ගෘහයෙහි හැඩය අනුව බෞද්ධ පොත්පත්වල දක්නට ලැබෙන ස්ථූප වර්ග තුනක නම් ලියන්න.

II අනුරාධපුරයෙහි පිහිටි පැරණි දාගැබ් තුනක් ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

III "බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය අනුව වැදගත් තැනක් හිමිවන්නේ දාගැබටයි." මෙම කියමන කරුණු දක්වමින් තහවුරු කරන්න.

## [[[[[ 1997 ]]]]] 06 වන ප්‍රශ්නය

I අනුරාධපුරයේ පිහිටි මිරිසවැටි,අභයගිරි(උත්තර චේතිය) , ජේතවනාරාමය දාගැබ් ගොඩනැංවූ බෞද්ධ රජවරුන් තිදෙනාගේ නම් ලියන්න.

II බෞද්ධ සාහිත්‍යයයේ දක්නට ලැබෙන බෞද්ධ ස්ථූප වර්ග නම් වශයෙන් දක්වන්න.

III බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පය අනුව දාගැබට වැදගත් තැනක් හිමිවන අයුරු පැහැදිලි කරන්න.

## [[[[[ 1996 ]]]]] 04 වන ප්‍රශ්නය

I ලක්දිව ගොඩනංවන ලද ප්‍රථම චෛත්‍යය කුමක්ද?

II එම චෛත්‍යය කවරකු විසින්, කුමක් නිදන් කොට කරවන ලද්දේද?

III "චේතියඝර" යනු කුමක්දැයි විස්තර කරන්න.

විද්‍යාල සංවර්ධන අමාත්‍යාංශය